**පරිසර අමාත්‍යංශයේ ජාතික ඕසෝන් ඒකකය**

**හැඳින්වීම**

ඕසෝන් ස්ථරය සංරක්ෂණය සහ රැකගැනීම සඳහාවූ ගෝලීය එකඟතාවය සාක්ෂාත් කිරීම පිණිස, ශ්‍රී ලංකා රජයද 1989 වසරේ දෙසැම්බර් මස 15 දින මොන්ට්‍රියල් සංධානයට සහ වියනා සම්මුතියට අත්සන් තැබීමෙන් සිය පරිසර හිතකාමී දායකත්වය දැක්විය. මොන්ට්‍රියල් සංධානයේ ප්‍රතිපත්තීන් සහ නියමිත කාර්යන් අප රට තුල නිසි අයුරින් ක්‍රියාත්මක කිරීමවස් 1994 වසරේදී පරිසර අමාත්‍යංශය යටතේ 'මොන්ට්‍රියල් සන්ධාන ඒකකය' නමින් විශේෂ ඒකකයක් ප්‍රතිෂ්ඨාපනය කල අතර 2003 වසරේ සිට ජාතික ඕසෝන් ඒකකය ලෙස හඳුන්වන මෙම ඒකකය පරිසර අමාත්‍යංශයේ ලේකම්තුමාගේ අධීක්ෂණය යටතේ සිය කටයුතු පවත්වා ගෙනයනු ලබයි.

ශ්‍රී ලංකාවතුල ඒක පුද්ගල ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය භාවිත අගය සංවර්ධිත රාජ්‍යන්හි එම අගයට සාපේක්ෂව බෙහෙවින් අඩු අගයක් එනම් කි.ග්‍රෑ. 0.3 පමණවන බැවින් ශ්‍රී ලංකාව මොන්ට්‍රියල් සංධානය 'කාණ්ඩ 5' ලෙස නම්කර ඇති රාජ්‍යයක් වශයෙන් හඳුන්වනු ලබයි.

**ජාතික ඕසෝන් ඒකකයේ දැක්ම** : ඕසෝන් ස්ථරය ප්‍රකෘති තත්වයට මුළුමනින් ගොඩ නැගීම

**ජාතික ඕසෝන් ඒකකයේ වගකීම් සහ කාර්යයන්**

- මොන්ට්‍රියල් සන්ධානයේ සහ වියනා සම්මුතියේ නාභිය කේන්ද්‍රය වශයෙන් පරිසර අමාත්‍යංශයේ අපේක්ෂාවන් සාක්ෂාත් කිරීම.
- ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය භාවිතයෙන් තුරන් කිරීම සඳහා ජාතික ආයතනයන්හි සහයෝගයෙන් එම කාර්යයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පසුවිපරම සිදුකිරීම.
- ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය භාවිතයෙන් තුරන් කිරීම සඳහා අවශ්‍යවන නීතිරාමු කෙටුම්පත් කිරීමට අදාල ආයතනයන්ට සහයවීම සහ ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය, භාවිතාකරන ලද ශීතකරණ/ වායු සමන උපකරණ ආනයනයේදී නීතිමය ලෙස අවශ්‍යවන බලපත්‍ර සඳහා නිර්දේශයන් ලබාදීම.
- ශීතකරණ/ වායු සමන කාර්මිකයන් අනුගමනය කලයුතු නිවැරදි පරිසර හිතකාමී තාක්ෂණයන් පිළිබඳ දැනුවත් කිරීම සඳහා 'යහපත් ශීතකරණ කාර්යයන්' යන මැයෙන් තාක්ෂණික වැඩමුළු පැවැත්වීම. ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය භාවිතයෙන් තුරන් කිරීම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම.
- මූල්‍යමය දිරිදීමනා සහ තාක්ෂණික දැන්වත් කිරීම තුලින් ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය භාවිතාකරන ලද විවිධ ක්ෂෙත්‍රයන් පරිසර හිතකාමී විකල්ප තාක්ෂණයන්ට යොමුකිරීමට දායකත්වය සැපයීම.
- නඩත්තු සහ සේවාවන්හිදි ශීතකරණ උපකරණ මගින් සිදුවිය හැකි ශීතකාරක විමෝචනය අවම කිරීමට ශීතකාරක එක්රැස් කිරීම සහ ප්‍රතිචක්‍රීයකරණ වැඩපිළිවෙල හඳුන්වාදීම සහ අවශ්‍ය පුහුණුවීම් ලබාදීම.
- ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මකවන ඕසෝන් ස්ථරය සංරක්ෂණය සහ රැකගැනීම පිළිබඳ කාර්යන්හි තොරතුරු සහ දත්තයන් දේශීය මෙන්ම ජාත්‍යන්තරව හුවමාරු කිරීම.

**ශ්‍රී ලංකාවතුල ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය භාවිතය**

**CFC :** ශීතකාරකයක් ලෙස (කර්මාන්ත සහ සේවා), විදින කාරකයක් ලෙස (සුවඳ විලවුන්, තීන්ත, පලිබෝධ නාශක සහ ෆෝම් වර්ග නිෂ්පාදනයේදී) 2008 ජනවාරි 01දා සිට ආනයනය තහනම් කර ඇත. (ඉතා සුළු වශයෙන් පැරණි ගෘහස්ථ ශීතකරණන්හි සහ පැරණි වාහන වායු සමනයන්ත්‍රයන්හි තවමත් භාවිතාවේ)

**MeBr:** පලිබෝධ නාශකයක් ලෙස සහ ධූමකාරකයක් ලෙස (වර්තමානයේදී මෙය නිරෝධායන සහ පෙරනැවිගත කිරීම කාර්යන් සඳහා ධූමකාරකයක් ලෙස භාවිතා කරයි)

**CTC සහ MC**: පවිත්‍රකාරකයක් ලෙස සහ CTC සක්‍රිය කාබන්හි තත්ව පරීක්ෂාව පිණිස (මෙම රසායනික ද්විත්වය භාවිතයෙන් මුළුමනින්ම තුරන් කර ඇත)

**හේලෝන් (Halon)** : ගිනි නිවීමේ ක්‍රියාකාරකයක් ලෙස (ශ්‍රී ලංකා ගුවන් හමුදාව පමණක් අත්‍යවශ්‍ය කටයුතු සඳහා භවිතා කරයි)

**HCFC :** ශීතකාරකයක් ලෙස සහ ෆෝම් වර්ග නිෂ්පාදනයේදී

**HCFC භාවිතයෙන් තුරන් කිරීමේ කළමණාකරන සැලැස්ම එළි දැක්වීම**

මොන්ට්‍රියල් සන්ධානයේ ප්‍රතිපත්තීන් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රමානුකූල එමෙන්ම නවතාවයකින් යුත් ක්‍රමවේදයන් මගින් CFC, CTC, MeBr, Mc හේලෝන් වැනි ප්‍රබල ඕසෝන් ක්ෂයකාරක ද්‍රව්‍ය කඩිනම්ව 2010 වසරවනවිට මුළුමනින් තුරන් කිරීමට හැකිවිය. මෙම අතිකරගත් සාර්ථකත්වය තුලින් සියලු කර්මාන්ත ක්ෂේත්‍රයන් CFC රහිත තාක්ෂණයන්ට පරිවර්තනය කිරීමට හැකිවිය. මෙසේ මහත් පරිශ්‍රමයෙන් උදාකරගත් සාර්ථකත්වයන් මොන්ට්‍රියල් සන්ධානයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කීරීමේ සාර්ථකම රාජ්‍යයට හිමි ගෞරවනීය සම්මානය 2007 වසරේදී ශ්‍රී ලංකාවට පුද කරන ලදී. අදියරගතව HCFC(හයිඩ්‍රොක්ලොරොෆ්ලොරොකාබන්) තුරන් කිරීම අපගේ ඊළඟ අභියෝගය වන අතර මෙම කාර්යය 2013 වසරේ ජනවාරි 01 වන දින සිට ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීමට නියමිතය.

වියානා සමුළුවේ වර්තමාන සභාපතිත්වය උසුලන පරිසර අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමාගේ මඟ පෙන්වීම යටතේ මොන්ට්‍රියල් සන්ධානයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන නාභිය ආයතනය වන පරිසර අමාත්‍යාංශය, එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන සමඟ එක්ව පිළියෙළ කරන ලද HCFC භාවිතයෙන් තුරන් කිරීමේ කළමණාකරන සැලැස්ම උත්සවාකාරයෙන් එළි දැක්වීම 2011 මාර්තු 31 වන දින කොළඹ ටාජ් සමුද්‍ර හෝටලයේදී පැවැත්වේ.

**ශ්‍රී ලංකාව HCFC භාවිතය තුරන් කිරීමේ කළමණාකරන සැලැස්ම සැකසීම**

HCFC භාවිතයෙන් තුරන් කිරීම ඕසෝන් ස්ථරය සුරැකීම හා දේශගුණ විපර්යාස අවම කිරීම යන කාර්යයන් දෙකටම ධනාත්මකව දායකවනු ඇත. එයට හේතුව වන්නේ එම රසායන ද්‍රව්‍යයන් සැළකිය යුතු ලෙස ඕසෝන් ක්ෂයකාරක විභවයකින් මෙන්ම (ODP =0.15) ගෝලීය උණුසුම් කරන විභවයකින් (GWPs) සහිත ඒවා වීමය. අනාගත දේශගුණය සුරැකීමේ ක්‍රමවේදයක්සේ මොන්ට්‍රියල් සන්ධානයට අයත් පාර්ශවයන් HCFC ඉවත් කිරීම කඩිනම් කිරීමට 2007 වසරේ දී තීරණය කරන ලදී.

ඒ අනුව ශ්‍රී ලංකාව මොන්ට්‍රියල් සන්ධානයේ ප්‍රතිපත්තීන් හා අනුකූලවන සමකාලවකවානුවලට යටත්ව ක්‍රමයෙන් සීමාකිරීම සඳහා කළමණාකරන සැලැස්මේ ආරම්භක සමුළුව 2009 වසරේ නොවැම්බර් මස පවත්වන ලද අතර ඉන් අනතුරුව HCFC භාවිතා කරන්නන්, ශීතකරණ හා වායුසමන කාර්මිකයන් සහ පුහුණු කිරීමේ ආයතන පිළිබඳ දිවයින පුරා සමීක්ෂණයක් පවත්වන ලදී. මෙම සමීක්ෂණය මඟින් රැස්කරගන්නා ලද දත්ත පාදක කොටගෙන HCFC අදියරගතව බැහැර කීරීම පිළිබඳව සේවාදායකින් දැනුවත් කිරීමේ දෙවන වැඩමුළුව 2010 ජුනි 06 වන දින පැවැත්විනි. මෙම වැඩමුළුවේ අවසානයේදි එලැඹි නිගමනයන්ට සහ යෝජනාවන්ට අනුරූපව ශ්‍රී ලංකාව තුළ HCFC භාවිතය තුරන් කිරීම සඳහා වන යෝජනා කෙටුම්පත ජාතික ඕසෝන් ඒකකය විසින් සකස් කර එම වසරේ නොවැම්බර් මස උගන්ඩාවේ කම්පලා නුවර පැවැත්වූ මොන්ට්‍රියල් සන්ධානයේ විධායක කමිටු රැස්වීමට අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. ඒ අනුව සංවර්ධනය වන්නා වූ රටවල HCFC පරිභෝජනය වසර 2013 දී උපරිමයක්සේ සළකා පියවරෙන් පියවර සීමාකර වසර 2025 දී සම්පූර්ණයෙන්ම භාවිතයෙන් තුරන් කිරීමට නියමිත වී ඇත.

**HCFC භාවිතය තුරන් කිරීමේ කළමණාකරන සැලැස්ම ශ්‍රී ලංකාව ආරම්භ කිරීම**

මෙම විමධ්‍යගත කමිටු තීරණයන්ට අනුව කර්මාන්ත ක්ෂේත්‍රය හැඩගැන්වීමේ ක්‍රමවේදයන්, තාක්ෂණික ක්‍රමවේදයට යොමු වීමේ වැදගත්කම සහ තාක්ෂණයන් පිළිබඳව, HCFC භාවිතා කරන ක්ෂේත්‍රයන්හි සියළු උපදේශකවරුන්, කාර්මික ශිල්පීන්, කර්මාන්ත ප්‍රධානීන්, HCFC ආනයනකරුවන් සහ අනෙකුත් සේවාදායකින් දැනුවත් කිරීම සඳහා , ජාතික ඕසෝන් ඒකකය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) සහ එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන (UNEP) සමඟ එක්ව මෙම වැඩමුළුව සංවිධානය කරන ලදී.